රත්නපුර මහා නගර සභාව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රත්නපුර මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට රත්නපුර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මාර්ග අලුත්වැඩියා වියදම් රු.16,585,615 ක් ප්‍රාග්ධනිත කර තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම නොවන වත්කම් සහ ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.	මේ පිළිබඳව නැවත සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් නිවැරදි කළ යුතුය.
(ආ)	කණාදොළ පුහුණු මධ්‍යස්ථානයේ වහලය සැකසීමේ කර්මාන්තයේ ණයහිමි ශේෂය රු.1,474,203 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු අතර, නිමි වැඩ වටිනාකම රු.433,646 ක් වැඩියෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.	ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් නිවැරදි කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂය තුළ ඉටු කරන ලද රු.1,842,562 ක් වටිනා කර්මාන්ත 04 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ මඟින් නිවැරදි කරන බව.	ගිණුම් නිවැරදි කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ වැඩ නිම කරන ලද තොග මත්ස්‍ය වෙළඳපොලේ නිමි වැඩ වටිනාකම රු.2,723,119 ක් වැඩියෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.	ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් නිවැරදි කළ යුතුය.

(ඉ)	සමාලෝචිත වර්ෂයේ වැඩ නිම කරන ලද රත්නපුර මහජන පොල ඉහල මහල ඉදිකිරීමේ කර්මාන්තයේ වටිනාකම රු.18,831,160 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.	ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් නිවැරදි කළ යුතුය.
(ඊ)	වාහන 02 ක වටිනාකම රු.30,200,000ක් වැඩියෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.	ජර්නල් සටහන් මඟින් ගැලපීමට කටයුතු කරන බව.	ගිණුම් නිවැරදි කළ යුතුය.
(උ)	රත්නපුර මැණික් වීදිය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා ගෙවිය යුතු හා පළාත් සභාවෙන් ලැබිය යුතු ශේෂය රු.5,276,986 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	නැවත සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් නිවැරදි කළ යුතුය.

1.6.2 නොසැසඳූ පාලන ගිණුම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ගිණුම් විෂයයන් 05 කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.20,901,614 ක වෙනසක් පැවැතිණි.	ලේඛනවල ඇති අඩුපාඩු හඳුනාගෙන 2025 වසරේ අවසාන ගිණුම සඳහා නිවැරදි ගිණුම් ශේෂයන් ලබා දීමට කටයුතු කරන බව.	වෙනසට හේතු හඳුනාගෙන ගිණුම් නිවැරදි කළ යුතුය.

1.7 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම්	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 අංක 19 දරන මහා නගර සහා ආඥා පනතේ 247 (1අ) වගන්තිය	මහා නගර සභා සීමාව තුළ වෘත්තියෙහි යෙදෙන වෘත්තිකයින් හඳුනාගෙන අදාළ වෘත්තිය සම්බන්ධයෙන් වූ බද්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පළාත් පාලන කොමසාරිස් විසින් නීති අංශය දැනුවත් කර ඇති බව හා එමඟින් ලැබෙන තීරණ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව.	මහා නගර සභා ආඥා පනත අනුව කටයුතු කළ යුතුය.

(ආ)	1998 දෙසැම්බර් 10 දිනැති අංක 98/3 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය	මහා නගර සභාව විසින් 2000, 2001 සහ 2017 යන වර්ෂයන්හි බදු දී ඇති කඩකාමර 12 ක් සඳහා ගිවිසුම් ගතවී නොතිබුණි.	මෙම කඩකාමර 12 සඳහා මේ දක්වා ගිවිසුම් ගතවී නොමැති බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,026,801 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.65,567,753 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
වරිපනම් හා බදු	39,615,000	38,654,168	42,221,090	39,321,223	35,800,000	40,242,108	41,336,757	38,436,194
කුලී	93,154,000	83,498,308	81,582,104	27,328,523	73,181,000	74,250,118	71,876,826	34,800,242
බලපත්‍ර ගාස්තු	19,200,000	20,621,546	21,008,997	9,158,835	18,485,000	17,954,340	15,560,390	9,285,500
වෙනත් ආදායම්	106,538,000	106,295,363	101,579,985	-	114,306,000	95,783,213	93,617,268	7,464,313
	258,507,000	249,069,385	246,392,176	75,808,581	241,772,000	228,229,779	222,391,241	89,986,249

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.30,106,640 ක් වූ අතර, හිඟ ශේෂය සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට සභාව අපොහොසත් විය.	මීට අදාළව කාල විශ්ලේෂණයක් දැනට භාවිත වරිපනම් මෘදුකාංගය මඟින් ලබා දිය නොහැකි බව හා හිඟ වරිපනම් අය කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතින බව.	කාල විශ්ලේෂණ සකස් කළයුතු අතර හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ)	පොදු වෙළඳපල සංකීර්ණයේ කඩකාමර 26 ක් සඳහා නව තක්සේරුව 2023 අප්‍රේල් 06 දින තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණ ද, එම වටිනාකම් අය නොකර පැරණි තක්සේරු කුලියම තවදුරටත් අය කිරීම හේතුවෙන් 2023 මැයි සිට 2024 දෙසැම්බර් දක්වා අහිමි වී තිබුණු මුළු ආදායම රු.6,450,720 ක් විය.	කඩකාමරවල වර්තමාන සැලැස්ම සහ ලබා දී ඇති තක්සේරු වාර්තාව සැසඳේ ද යන්න පිළිබඳව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වාර්තාවක් ලබා ගැනීමටත්, එකී වාර්තාව අනුව කුලී මුදල් 2023 වර්ෂයේ මැයි මස සිට ක්‍රියාත්මක වන පරිදි අය කිරීමටත් කටයුතු කරන බව.	තක්සේරුව අනුව අයවියයුතු කුලී ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	කඩකාමර 125 ක බදුකරුවන් සමඟ එළඹි ගිවිසුම්වල වලංගු කාලය අවසන් වී තිබුණ ද, 2025 මැයි වන විටත් නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම කඩ කුලිය සංශෝධනය සඳහා වසර 05 කට වරක් කඩකාමර තක්සේරු කළයුතු වුවත්, සභාව සතු කඩකාමර 195 ක තක්සේරුව එපරිදි සිදුකර නොතිබුණි.	මේ සඳහා පත් කරන ලද කමිටුව විසින් සංශෝධිත ගිවිසුම සකස් කරමින් පවතින බව හා තක්සේරු වාර්තා ලබා ගැනීම සඳහා නැවත සිහිකැඳවීමක් සිදු කිරීමටත්, තක්සේරු වාර්තා ලද පසු නව තක්සේරුව මත කුලී අය කිරීමටත් කටයුතු කරන බව.	බදු ගිවිසුම් අලුත් කිරීමටත්, වසර 05 කට වරක් කඩකාමර තක්සේරු කර කඩ කුලිය අය කිරීමටත් කටයුතු කළ යුතුය.
(ඈ)	මහා නගර සභාවට අයත් කඩකාමර 60 කින් 2024 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු හිඟ කඩකුලී රු.4,133,755 ක් සම්බන්ධයෙන් මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 155 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	හිඟ මුදල් අයකර ගැනීම සඳහා බදුකරුවන් සමඟ සාකච්ඡා කර කාල රාමුවකට අනුව ගෙවීම් ක්‍රමවේද සකස් කර දී ඇති බව හා ඒ අනුව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	වාහන නැවතුම් ස්ථාන තුනක වාහන නැවතුම් ගාස්තු අය කිරීමේ ටෙන්ඩර ලබාගෙන තිබුණු බදුකරුවෙකු විසින් ගිවිසුම්ගත පරිදි මාසික ගාස්තු ගෙවා නොතිබියදී, ටෙන්ඩර් ගිවිසුමේ 14 වගන්තිය අනුව දින 14 ක් තුළ ටෙන්ඩරය අවලංගු කර හිඟ ගාස්තු ඇප තැන්පතුවලින් හිලව් කර ගැනීමට කටයුතු නොකිරීම නිසා සභා අරමුදලට රු.510,229 ක පාඩුවක් සිදුව තිබුණි.	ගෙවිය යුතු හිඟ මුදල් සඳහා තැන්පතුව හිලව් කර ඉතිරි හිඟ මුදල ගෙවන ලෙස දන්වා නීතිඥවරිය මාර්ගයෙන් බදුකරු වෙත එන්තරවාසි නිකුත් කර ඇති බව හා මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතින බව.	ටෙන්ඩරය අවලංගු කිරීමටත්, හිඟ ගාස්තු අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.

(ඊ)	ආයතන 103 ක දැන්වීම් පුවරු 149 ක් සඳහා ඉකුත් වර්ෂයට අදාළව අයවියයුතු රු.4,255,250 ක් 2025 මැයි වන විටත් අයකරගෙන නොතිබුණි.	ඉකුත් වර්ෂයට අදාළ ගාස්තු නොගෙවන ලද දැන්වීම් පුවරු සඳහා ගාස්තු ගෙවීමට කටයුතු කරන ලෙස ලිඛිතව හා වාචිකව අදාළ ආයතන වෙත වරින් වර දැනුවත් කළද ගාස්තු නොගෙවීම නිසා මෙම පුවරු ගලවා ඉවත් කිරීමට කටයුතු කරන ලෙස ඊට බලය පවරා ඇති නිලධාරී වෙත දැනුම් දී ඇති බව.	හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	මල්වල පාර හා ජලාශය පාර යන ප්‍රදේශවල පිහිටා ඇති නිවාස 22 ක, වර්තමානයේදී මහා නගර සභාවේ සේවකයින් නොවන පදිංචිකරුවන් 22 ක් ගිවිසුම් ගතවීමකින් හා කුලී ගෙවීමකින් තොරව පදිංචි වී සිටියද, ගිවිසුම්ගතව කුලී අයකර ගැනීමට හෝ එම නිවාස නැවත සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 12 දරන පළාත් පාලන ආයතන නිල නිවාස (සන්තකය ආපසු පවරා ගැනීම) පනත යටතේ හෝ 1969 අංක 07 දරන රජයේ නිල නිවාස පවරා ගැනීමේ පනත යටතේ ක්‍රියා කිරීමට කටයුතු කරන බව.	එම නිවාස නැවත සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	රත්නපුර නීතිඥ සංගමය වෙත බදු දී තිබුණු අපර් ක්ලබ් ගොඩනැගිල්ලේ සන්තකය නැවත පවරාගෙන වසරකට වැඩි කාලයක් ගතව තිබුණ ද, 2025 මැයි වනවිටත් නිෂ්කාර්යයව පැවැතිණි. එමෙන්ම, එම දේපල ආදායම් උත්පාදන කාර්යයක් සඳහා යෙදවීමට 2023 දෙසැම්බර් මස පත්කර තිබුණු කමිටුව විසින් සකස් කර තිබුණු වාර්තාව අසම්පූර්ණ බැවින් නව වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරන ලෙස ආණ්ඩුකාරවර උපදෙස් ලැබී	නීතිඥ සංගමය විසින් නැවත නඩුකරයක් ගොණු කිරීම නිසා එම නඩුවේ තීන්දුව ලැබීමට ප්‍රථම ව්‍යාපෘති සඳහා වියදම් දැරීම ගැටළු සහගතවීමට ඉඩ ඇති බැවින්, දැනට ආණ්ඩුකාරතුමිය වෙත අනුමැතියට යොමුකර ඇති, රු.1,600,000 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලද පසු ඉදිරි කටයුතු සිදුකළ හැකි බව.	අදාළ දේපළ ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය.

	තිබුණ ද, 2025 මැයි වන විටත් විධිමත් ව්‍යාපෘති සැලැස්මක් සකස් කර නොතිබුණි.		
(ඇ)	එකතුව රු.392,896,497 ක් වූ වත්කම් විෂයයන් 03 කට අදාළ වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණු අතර විස්තරාත්මක උප ලේඛන ද පිළියෙල කර නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වත්කම් ලේඛන යාවත්කාලීන කළ යුතු අතර විස්තරාත්මක උප ලේඛන සකස් කළ යුතුය.
(ඈ)	වසර කිහිපයක සිට ඉදිරියට එන රු.165,974 ක අහරු චෙක්පත් ශේෂය නිරවුල් කර නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	වසර 04 ක සිට ඉදිරියට ගෙන එන රු.18,913,594 ක අභ්‍යන්තර මුදල් මාරු ගිණුමේ බැර ශේෂය නිරවුල් කර නොතිබුණි.	නැවත පරීක්ෂා කර ශේෂය නිවරදි කිරීමට කටයුතු කරන බව.	ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	2021 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එන පිළිවෙලින් රු.1,559,433 ක හා රු.600,254 ක අංශ ව්‍යාපෘති ණය හා ට්‍රැක්ටර් ණය හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි.	දේශිය ණය සංවර්ධන අරමුදලෙන් තහවුරුවක් ලබා නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(උ)	2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.8,397,991 ක් වූ තානායම් කුලිය නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	හිඟ තානායම් කුලිය ආසියානු සංවර්ධන බැංකුවෙන් රත්නපුර මහා නගර සභාව විසින් ලබාගත් ණය මුදල සඳහා හිලව් කර ගැනීමට කටයුතු කරමින් පවතින බව.	හිඟ ආදායම් අයකර ගැනීමට හෝ ණය මුදල සඳහා හිලව් කර ඇති බව තහවුරු කරගැනීමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2002 මාර්තු 13 දින එළඹි ගිවිසුමේ කොන්දේසි අංක 03 ප්‍රකාරව, සෑම අවුරුදු 05 කට පැරණි බස් නැවතුම්පල වෙළඳ සංකීර්ණය බදු දීමට අදාළව 2022 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මාසික වෙළඳපල කුලිය රු.460,000 ක් බව තක්සේරු කර තිබුණි. ඒ සම්බන්ධයෙන් 2022 අගෝස්තු 24 දින පැවති සාකච්ඡාවේදී නව තක්සේරු කුලිය ගෙවීමට හා නව ගිවිසුමකට එළඹීමට සභාව හා බදුකරුවන් එකඟ වී තිබුණද, 2024 දෙසැම්බර් වන විටත් නව තක්සේරු කුලිය අයකරගෙන නොතිබීමෙන් සභා අරමුදලට රු.6,160,000 ක පාඩුවක් සිදුව තිබුණි. තවද 2022 අප්‍රේල් සිට අගෝස්තු දක්වා කාලසීමාවට අදාළ ප්‍රමාද ගාස්තු වශයෙන් අයවිය යුතු රු.240,000 ක් ද අය කරගෙන නොතිබුණි.	නව තක්සේරු වාර්තාව සහ බදු ගිවිසුම සලකා බලා කුලී මුදල් ප්‍රතිශෝධනය කිරීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව නීති නිලධාරිනියගෙන් උපදෙස් ලබා ගැනීමට කටයුතු කළ අතර, ඒ අනුව ගිවිසුම ප්‍රකාරව බදු මුදල් ප්‍රතිශෝධනය කළ හැකි වන්නේ 2027 වර්ෂයේ දී බවට උපදෙස් ලැබී ඇති බව හා 2022 අප්‍රේල් සිට අගෝස්තු දක්වා නගර සභාවට අයවීමට ඇති රු.240,000 ක මුදල අයකර ගැනීමට කටයුතු කරන බව.	නව තක්සේරු කුලිය සහ ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	1987 අංක 19 දරන මහා නගර සභා ආඥා පනතෙහි (252 අධිකාරිය) 247ඇ(1) අනුව මහා නගර සභාවක පාලන සීමා තුළ පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සුදුසු වන විටක හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ ඒ සභාවේ මතය අනුව යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි වන විටක එසේ සිදුකර නොමැති නම් ඒ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට 02 ක් නොඉක්මවන ප්‍රමාණයක බද්දක් සභාව විසින් ඒ ඉඩමේ අයිතිකරු විෂයයෙහි වාර්ෂිකව නියම කළ යුතුය. 2019 මැයි 29 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව මගින් ද	මේ වනවිට රත්නපුර නගර සභා සීමාව තුළ සංවර්ධනය නොකරන ලද හිස් ඉඩම්, පුරන් කුඹුරු අනෙකුත් ඉඩම් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ගොවිජන සේවා දෙපාර්තුමේන්තුව ලිඛිත දැනුවත් කර ඇත. එම වාර්තාව ලද පසු සමීක්ෂණයක් කොට තොරතුරු ලබාගෙන තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර තක්සේරුව ලැබීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කරන බව.	මහා නගර සභා ආඥා පනත අනුව කටයුතු කළ යුතුය.

ඉඩම් හිමිකරුවන්ගේ තොරතුරු රැස්කිරීමට හා පනත ප්‍රකාරව කටයුතු කිරීමට තීරණය කර තිබුණද, 2025 මැයි වන විටත් එවැනි ඉඩම් හඳුනා ගෙන බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
අංක 03/2022 දරන හා 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛයෙහි XVI වන වගන්තිය සහ අංක 08/2022 දරන 2022 නොවැම්බර් 25 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය මඟින්, රාජ්‍ය ආයතන විසින් පවත්වන උත්සව සහ විවෘත කිරීම් සඳහා රාජ්‍ය මුදල් වියදම් නොකරන ලෙසට උපදෙස් ලබා දී තිබියදී, ඊට පටහැනිව 2024 මාර්තු 27 දින පවත්වා තිබුණු රත්නපුර නව නගරය නාගරික උද්‍යානය ඉදිකිරීමේ ආරම්භක උත්සවය වෙනුවෙන් මහා නගර සභා අරමුදලින් රු.944,050 ක් වැයකර තිබුණි.	රත්නපුර නාගරික උද්‍යානය ඉදිකිරීමේ වැඩ කටයුතු ආරම්භ කිරීමේ උත්සවය සංවිධාන කටයුතු සඳහා වියදම් වන මුදල ව්‍යාපෘතිය සඳහා වෙන් වන පරිපාලන මුදලින්, ප්‍රතිපූරණය කර දෙන බව එදින පැවැත්වූ සාකච්ඡාවේදී ප්‍රධාන ලේකම්තුමා විසින් දන්වා වියදම් සභාව විසින් දැරූ බව හා දරන ලද වියදම් ප්‍රතිපූරණය කර ගැනීම සඳහා අදාළ ආයතනය වෙත ලිපි යොමු කර ඇති බව.	චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව දරන ලද වියදම් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කණාදොළ කසළ අංගනයේ වහලය සඳහා මිලදී ගෙන තිබුණු වැහි පීලි හා ඩවුන් පයිප්ප පිරිවිතරවලට අනුකූල නොවී තිබියදී, ඒවා නියමිත පිරිවිතරවලට අනුකූල බවට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලබා දී තිබුණු නිර්දේශය මත රු.118,500 ක් ගෙවා තිබුණි.	පිරිවිතර අනුව වැහි පීලි සපයා ඇති අතර, එය කණාදොළ කසළ අංගනයේ සවි කර ඇති බව හා අදාළ ප්‍රමාණයේ ජල බස්නා නල වෙළඳපොලේ නොමැති බැවින් විශේෂයෙන් සකස් කර ගෙන්වීමට කටයුතු කර ඇති බව.	නියමිත පිරිවිතරවලට අනුකූල නොවන සැපයුම් සඳහා ගෙවීම් නොකළ යුතුය.

(ආ)	මහා නගර සභාව මගින් සමාලෝචිත වර්ෂය තුළ තාර මිලදී ගැනීමේදී, සැපයූ තාර නියමිත ප්‍රමිතියට (SLS ISO 9001-2015) අනුකූල ද යන්න තහවුරු කර ගැනීමකින් තොරව රු.1,350,000 ක් ගෙවා තිබුණි.	මේ වන විට තාර මිලදී ගැනීමේදී, ඇණවුමෙන් ඇණවුමට තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබාගෙන මිලදී ගැනීම් සිදු කරන බව.	නියමිත ප්‍රමිතියට අනුකූල ද යන්න තහවුරු කර ගෙන ගෙවීම් කළ යුතුය.

3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහජන පොළ තොග මත්ස්‍ය වෙළඳපල ඉදිකිරීමේ කර්මාන්තයේ වැඩ විෂයයන් 04 ක් සඳහා රු.551,800 ක් වැඩිපුර ගෙවා තිබුණි.	වැඩ විෂයයන් ඉටු කළ දින වකවානුවට අදාළව සමිතිය විසින් ඉදිරිපත් කළ බිල්පත අනුව වෙළෙඳපොල මිල සලකා බලා ගෙවීම් සිදු කරන ලද බව.	වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගත යුතුය.
(ආ)	වැඩ වටිනාකම රු.1,639,142 ක් වූ මහජන සතිපොළ ප්‍රවේශ මාර්ගය Asphalt Concrete යොදා පිළිසකර කිරීමේ කර්මාන්තය 2024 ජූලි 20 දින වැඩ අවසන් කර තිබුණ ද, නියමිත ප්‍රමිතියට නිම කර නොතිබීම හේතුවෙන් 2025 අප්‍රේල් වන විටත් මාර්ගයේ ගල් ගැලවී යමින් පැවතිණි.	මාර්ගයේ කෙළවරවල් වල හොඳින් සනවත් වී නොමැති Primix කොටස් තිබෙන්නට ඇති බව, එය අතුගා ඉවත් කිරීමට කටයුතු කරන බවත් එසේ කල පසු කඩතොළු වී ඇති කොටස් නිරීක්ෂණය වේ නම් එය කර්මාන්තය ඉටු කළ සමිතිය ලවා නිවැරදි කිරීමට කටයුතු කරන බව.	සංවර්ධන ව්‍යාපෘති නියමිත ප්‍රමිතියට නිම කළ යුතු අතර ඒවායේ අධීක්ෂණය විධිමත් කළ යුතුය.

3.6 වාහන පද්ධතිය කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
අපහරණය කළ යුතු වාහන හඳුනා ගැනීමේ තාක්ෂණික කමිටුව විසින් අලුත්වැඩියා කර ධාවනයට එක් කිරීම සුදුසු බවට 2023 ඔක්තෝබර් 16 දින නිර්දේශ කර තිබුණු ටිපර් රථයක් 2025 මැයි වන විටත් අලුත්වැඩියා කර නොතිබුණි.	රත්නපුර අවට අනුමත ගරාජ් විසින් මෙම රථය අලුත්වැඩියා කිරීමට උනන්දුවක් නොදැක්වීම හේතුවෙන් වෙනත් ආයතනයක් මගින් අලුත්වැඩියා කර ගැනිමට සිදුව ඇති බව.	අලුත්වැඩියාව අප්‍රමාදව සිදුකළ යුතුය.

4. **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීම සම්බන්ධයෙන් දිගුකාලීන සැලැස්මක් 2025 මැයි වන විටත් සකස් කර නොතිබුණි.	2024-2026 කාලපරිච්ඡේදය සඳහා වන තිරසර සංවර්ධන සැලැස්ම සකස් කරමින් පවතින බව.	තිරසර සංවර්ධන සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.